**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி cau; கல்வி kw;Wk; njhopw; கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv.Level) Examination, 2025

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය **I**
தொடர்பாடலும் ஊடகக் கற்கையும் **I**
Communication and Media Studies **I**

**29 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුරු තෝරාගෙන, උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

01. “තොරතුරු ගැබ් වූ සංඥාවක් කරණ කොටගෙන දෙපාර්ශවය අතර එක හා සමාන චිත්ත ස්වභාවයක් ඇති වීම සන්නිවේදනය යි”
මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,
(1) ශැනන් හා වීවර් ය.
(2) විල්බර් ශ්‍රාම් ය.
(3) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
(4) චාල්ස් එච්. කූලි ය.
(5) ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය යි.

02. යුධ තොරතුරු ලබාදීමට භාවිත කළ මාධ්‍ය ජනතාව වෙනුවෙන් භාවිත කරන ලෙස ප්‍රථමවරට ප්‍රකාශ කළේ,
(1) විල්බර් ශ්‍රාම් ය.
(2) ඊ.බී. ටයිලර් ය.
(3) ජෝන් රීත් සාමිවරයා ය.
(4) ඇරිස්ටෝටල් පඬිවරයා ය.
(5) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.

03. සන්නිවේදන ක්‍රියාවලියට අදාළ වන මූලිකාංග තුනක්(03) දැක්වෙන වරණය වන්නේ,
(1) සන්නිවේදකයා, සන්දර්භය, පෙළඹවීම.
(2) තොරතුරු සම්පාදනය, නාලිකාව, බලපෑම.
(3) සන්නිවේදකයා, සන්දේශය, ග්‍රාහකයා.
(4) සුපරීක්ෂණය, ප්‍රතිපෝෂණය, ග්‍රාහකයා.
(5) සන්නිවේදකයා, සන්දේශය, පෙළඹවීම.

04. මුවින් පිටවන වචන හා ශබ්ද අනුසාරයෙන් විවිධ අර්ථ ජනනය කිරීම අයත්වන සන්නිවේදන ස්වරූපය වන්නේ,

(1) වාචික සන්නිවේදනයයි .

(2) ශ්‍රව්‍ය සන්නිවේදනයයි.

(3) රූපණයයි.

(4) කථන සන්නිවේදනයයි.

(5) නිර්වාචික සන්නිවේදනයයි.

05. සන්නිවේදනය ක්‍රියා පටිපාටියකි. මෙම ප්‍රකාශයෙන් අදහස් වන්නේ,

(1) සන්නිවේදනයක් සිදු වන්නේ කිසියම් සන්දර්භයක් තුළ බවයි.

(2) සන්නිවේදනය ගනුදෙනුවක් වන බවයි.

(3) සන්නිවේදනය කිසිවිටෙකත් හුදෙකලාව පවතින වෙනස් නොවන දෙයක් නොවන බවයි.

(4) සන්නිවේදනය සංකේතාත්මක ක්‍රියාවලියක් වන බවයි.

(5) සන්නිවේදනය සාර්ථකවීමට නම් සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර පැහැදිලි අරමුණක් පිළිබඳ අවබෝධයක් තිබීම වැදගත් බවයි.

06. අලුත් අවුරුදු උදාවත් සමග නැවුම් මුට්ටියක කිරි ඉතිරවීමේ චාරිත්‍රය තවමත් ගැමියන් අතර ප්‍රචලිතය. සාම්ප්‍රදායික සන්නිවේදනයේ සුවිශේෂිතාවක් ලෙස මෙය,

(1) තේමාත්මක අන්තර්ගතයට අයත් වූවකි.

(2) සරල ව්‍යුහයකින් යුක්ත වූවකි.

(3) සංස්කෘතික සන්දර්භයට අයත් වූවකි.

(4) නම්‍යශීලීත්වයෙන් යුක්ත වූවකි.

(5) ශාන්තිකර්ම හා යාතුකර්මවලට අයත් වූවකි.

07. මාධ්‍යවල මූලික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- අධිපාඨනීයත්වය සහිත ය.
- පෞද්ගලික/ ගෘහස්ත සමීපතාවකින් යුක්ත ය.
- සරල ජංගම මාධ්‍යයකි.
- අඛණ්ඩව ප්‍රකාශයට පත් කරයි.

මෙම ලක්ෂණවලට ගැළපෙන මාධ්‍ය පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) නව මාධ්‍ය, ගුවන්විදුලිය, රූපවාහිනිය, පුවත්පත්


(2) සමාජ මාධ්‍ය, රූපවාහිනිය, පුවත්පත්, ගුවන්විදුලිය

(3) නව මාධ්‍ය, රූපවාහිනිය, ගුවන්විදුලිය, සඟරා

(4) සමාජ මාධ්‍ය, ගුවන්විදුලිය, පුවත්පත්, රූපවාහිනිය

(5) නව මාධ්‍ය, රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත

- අංක 08 සිට 10 දක්වා වූ ප්‍රශ්න සඳහා පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.




සන්දේශය සංඥා ලැබූ සංඥා සන්දේශය

08. ඉහත සන්නිවේදන ආකෘතියේ A, B, C, D, E අනුපිළිවෙලින් සඳහන් වරණය වන්නේ,

(1) සන්නිවේදකයා, පණිවිඩය, මාධ්‍ය, ග්‍රාහකයා, බාධක.

(2) තොරතුරු මූලාශ්‍රය, සම්ප්‍රේෂකය, ග්‍රාහකයා, සන්දේශාන්තය, බාධක.

(3) සන්නිවේදකයා, සම්ප්‍රේෂකය, ග්‍රාහකයා, බලපෑම, ප්‍රතිපෝෂණය.

(4) තොරතුරු මූලාශ්‍රය, පණිවිඩය, බාධක, ග්‍රාහකයා, සන්දේශාන්තය.

(5) සන්නිවේදනය, මාධ්‍ය, සන්දේශය, සන්දේශාන්තය, බලපෑම.

09. ඉහත ආකෘතියේ 'C' ට සමානව විල්බර් ශ්‍රාම් ආකෘතියේ ඇති සන්නිවේදන මූලිකාංගය,

(1) බලපෑම

(2) ආකේතකරය

(3) විකේතකරය

(4) සන්නිවේදක

(5) ප්‍රතිපෝෂණය

10. ඉහත ආකෘතියේ සුවිශේෂතා සඳහන් වරණය වන්නේ,

(1) රේඛීය බව හා ප්‍රතිපෝෂණය පිළිබඳ විස්තර කිරීම.

(2) බාධක හා ප්‍රතිපෝෂණය පිළිබඳ අවධානය යොමු කිරීම.

(3) ඒකමාර්ගික වීම හා සන්නිවේදනයේ අඛණ්ඩ බව විග්‍රහ කිරීම.

(4) සම්ප්‍රේෂණ හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය විස්තර කිරීම.

(5) සන්නිවේදන හා ග්‍රාහක භූමිකා හුවමාරුව පිළිබඳ විග්‍රහ වීම.

11. නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය පාසල් දරුවන්ට කරන බලපෑම කෙබඳු ද යන්න විද්‍යාත්මකව හඳුනාගැනීමට වඩාත් යෝග්‍ය වන්නේ,

(1) ජන මාධ්‍ය ඇසුරු කිරීමයි.

(2) විධිමත් ආයතනයක පාඨමාලාවක් හැදෑරීමයි.

(3) සමීක්ෂණයක් සිදු කිරීමයි.

(4) ජනමත නායකයන්ගෙන් විමසීමයි.

(5) නියාමකයින්ගේ නිර්දේශ විමසා බැලීමයි.

12. මියන්මාරයේ සිදු වූ දරුණු භූමිකම්පාවේ දර්ශන එසැනින් ලොව පුරා ජන මාධ්‍ය වෙත ගලා ආවේය. ඒ සඳහා බහුලව භාවිත වූ සන්නිවේදන වර්ගය වන්නේ,

(1) සමූහ සන්නිවේදනයයි.

(2) මහජන සන්නිවේදනයයි .

(3) අන්තර්පුද්ගල සන්නිවේදනයයි.

(4) අතථ්‍ය සන්නිවේදනයයි.

(5) ජන සන්නිවේදනයයි.

13. පහත දැක්වෙන්නේ සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් සිසුන් තිදෙනෙක් අතර ඇති වූ කතා බහකි. ඒ ඇසුරෙන් 13 හා 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශිරෝමී : අපිට ඕන මාතෘකාවක් ගැන සන්දේශයක් සමාජ මාධ්‍යයට එක් කරන්න පුළුවන්.

ෆාරා : හැමදේම දාන්න බැහැ. නීති රීති තියනවා.

ඉසුරු : අපි SMS, ෆොටෝ, ලිපි, වීඩියෝ හදලා අප්ලෝඩ්/ උඩුගත (upload) කරනවානේ.

ගයාන් : වේගවත්ව ඒවා හුවමාරු වෙනවා වගේම විශ්වසනීයයි.

මෙයින් නිවැරදි අදහස් ඉදිරිපත් කරනු ලබන්නේ,

(1) ශිරෝමී හා ගයාන් ය.

(2) ශිරෝමී පමණි.

(3) ගයාන් පමණි.

(4) ශිරෝමී, ඉසුරු හා ෆාරා පමණි.

(5) ශිරෝමී, ඉසුරු හා ගයාන් ය.

14. ෆාරා සඳහන් කළ ආකාරයට සමාජ මාධ්‍ය අනිසි ලෙස භාවිත කළ අවස්ථාවක පැමිණිලි කළ හැකි ආයතනය වන්නේ,

(1) පුවත්පත් පැමිණිලි කොමිසම.

(2) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය.

(3) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව.

(4) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.

(5) ජන මාධ්‍ය අමාත්‍යාංශය.

15. සමාජ මාධ්‍ය පිටුවක පළ වූ ප්‍රසිද්ධ ඇමතිවරයෙකු පිළිබඳ පුවත වේගයෙන් ජන ගත වූ අතර එහි කිසිදු නිල ස්වභාවයක් නොමැති වුව ද ඔහු කෙරෙහි ජනතා විරෝධය දැඩි විය.

මේ සිදුවීමට අදාළ සන්නිවේදන ස්වරූපය,

(1) දෘශ්‍ය සන්නිවේදනයයි.

(2) විධිමත් සන්නිවේදනයයි.

(3) අතථ්‍ය සන්නිවේදනයයි.

(4) අවාචික සන්නිවේදනයයි.

(5) අවිධිමත් සන්නිවේදනයයි.

16. පාප් වහන්සේ ශ්‍රී ලංකාවට පැමිණි සුවිශේෂ අවස්ථාවේ අතුරු සිදුරු නොමැතිව ගෝල්ෆේස් පිටිය පිරී ගොස් තිබුණි.

මේ අවස්ථාවේ භාවිත වූ සන්නිවේදන වර්ගය,

(1) ජන සන්නිවේදනයයි.

(2) මහජන සන්නිවේදනයයි.

(3) අතථ්‍ය සන්නිවේදනයයි.

(4) සමූහ සන්නිවේදනයයි.

(5) ගෝලීය සන්නිවේදනයයි.

17. සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ රෝම සම්මුතියට ඇතුළත් **නොවන** කරුණක් වන්නේ,

(1) සංවාදය මත පදනම් වූ සමාජ ක්‍රියාවලියකි.

(2) පුළුල් පරාසයක මෙවලම් හා ක්‍රම භාවිත වේ.

(3) ස්ථිරසාර සංවර්ධනයක් සඳහා සවන් දීම, විශ්වාසය ගොඩ නැගීම හඳුනාගනියි.

(4) ද්විමාර්ගික සන්නිවේදන පද්ධති මගින් ප්‍රජාවන්ට ඔවුන්ගේ අභිලාෂ, උවමනා ප්‍රකාශ කිරීමට හැකියි.

(5) සංවර්ධනය සඳහා සන්නිවේදනය මහජන සම්බන්ධතාව හෝ ආයතනික සන්නිවේදනය නොවේ.

18. හඬ සම්ප්‍රේෂණය කරන මාධ්‍යයක් ලෙස ගුවන් විදුලියේ මූලික ලක්ෂණ අතරට අයත් වන්නේ,

(1) සංකීර්ණතාවකින් යුත් මාධ්‍යයක් වීම.

(2) හුදු විනෝදාස්වාදය සඳහා ම වැඩසටහන් නිෂ්පාදනය වීම.

(3) ශ්‍රව්‍ය මාධ්‍යයක් ලෙස පරිකල්පන ශක්තිය ගොඩනැගීම ප්‍රබල වීම.

(4) ශ්‍රාවක රුචිකත්වයට වඩා වාණිජ පරමාර්ථ ප්‍රමුඛ වීම.

(5) සීමිත කලාපයක් ආවරණය කිරීමට සමත් වීම.

19. යුරෝපා කොමිසම විසින් මාධ්‍ය සාක්ෂරතාව නිර්වචනය කරමින් දක්වන කරුණු ඇතුළත් වරණය වන්නේ,

(1) මාධ්‍යයන්ට ප්‍රවේශ වීම, මාධ්‍ය විශ්ලේෂණය, මාධ්‍ය ඇගයීම, මාධ්‍ය නිර්මාණය යන්නයි.

(2) මාධ්‍ය සන්දේශ අර්ථකථනය මාධ්‍යයට විවෘත ද යන්න පිළිබඳ පර්යාලෝකය යන්නයි.

(3) ස්වකීය මාධ්‍ය සන්දේශ නිර්මාණය, මාධ්‍ය සන්දේශ විචාරශීලී චින්තනයෙන් යුතුව වටහා ගැනීම යන්නයි.

(4) සෑම ආකාරයෙන්ම ඉදිරිපත් කරන සන්දේශ පරිහරණය කිරීමට, විශ්ලේෂණය කිරීමට ඇගයුමට හා නිර්මාණය කිරීමට ලබන හැකියාව යන්නයි.

(5) මාධ්‍ය තුළ ක්‍රියාශීලී ව කටයුතු කිරීම, සන්දේශ අර්ථකථනය කර ගැනීම, මාධ්‍ය ඇගයීම, ස්වකීය සන්දේශ නිර්මාණය කරගැනීමට මාධ්‍ය භාවිත කිරීම යන්නයි.

20. විචාරශීලී ග්‍රාහකයකු සතු විය යුතු කුසලතාවක් ලෙස "අනුමානය" යන්නෙන් අදහස් කරන්නේ,

(1) පොදු කරුණු උපයෝගී කරගෙන විශේෂ දෙයක් පැහැදිලි කිරීමයි.

(2) කුඩා කරුණු ප්‍රමාණයක විද්‍යාමාන වන රටාව මත වැඩි කරුණු ප්‍රමාණයක පොදු රටාව හඳුනාගැනීමයි.

(3) ප්‍රවෘත්තියක එන කරුණුවල සමාන අසමාන කොටස සැසඳීමයි.

(4) තිබෙන කොටස් ආශ්‍රයෙන් අලුත් යමක් ගොඩනගා ගැනීමයි.

(5) සන්දේශයක් තේරුම් ගත හැකි ආකාරයට කොටස් කිරීමයි.

21. පහත A කොටස හා B කොටස සැලකිල්ලට ගන්න.

| A | B |
|---|---|
| A - සාම්ප්‍රදායික සංස්කෘතිය | 1.ජනයාගේ සාමූහික ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයකි. |
| B - ජන සංස්කෘතිය | 2.විද්‍යාවේ, අධ්‍යාපනයේ සහ කලාවේ උසස් ජයග්‍රහණවල ප්‍රතිඵලයකි. |
| C - සම්භාව්‍ය සංස්කෘතිය | 3.නිෂ්පාදන අතිරික්තතයක් සහ සුලභ බවින් යුක්තයි. |
| D - ජනප්‍රිය සංස්කෘතිය | 4.මූලික වශයෙන් උත්තරීතර සහ පූජනීය සංකේත පද්ධතියක් මත ගොඩ නැගී ඇත. |

ඉහත කරුණු අතර නිවැරදි සබඳතාවක් පවතින වරණය වන්නේ,

(1) A – 3, B – 2, C – 1, D - 4 වේ.

(2) A – 2, B – 3, C – 4, D - 1 වේ.

(3) A – 1, B – 2, C – 4, D - 3 වේ.

(4) A – 4, B – 2, C – 1, D - 3 වේ.

(5) A – 4, B – 1, C – 2, D - 3 වේ.

22. මෑතක දී ශ්‍රී ලංකාව තුළ ඉමහත් ජනාදරයට පත් සිනමා කෘතියක් සඳහා ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය (Public Performance Board) විසින් ලබා දුන් චිත්‍රපට වර්ගීකරණ සහතිකයේ සඳහන්ව ඇත්තේ "U" සහතිකයයි. මින් අදහස් වන්නේ,

1) වැඩිහිටියන්ට පමණක් සුදුසු ය.
2) අසීමාන්ත මහජන ප්‍රදර්ශනයට සුදුසු ය.
3) වැඩිහිටියන් සමඟ පැමිණෙන වයස අවුරුදු 18ට අඩු ළමයින්ට ද නැරඹිය හැකි ය.
4) වැඩිහිටියන්ට වඩාත් සුදුසු ය.
5) අවුරුදු 18ට වැඩි ඕනෑම කෙනෙකුට නැරඹිය හැකි ය.

23. මාධ්‍ය අභිසාරීතාව යන්නෙන් අදහස් වන්නේ,

(1) දත්ත පරිගණකගත කිරීමයි.
(2) තොරතුරු ජාලා එකිනෙකට සම්බන්ධ කිරීමයි.
(3) සියලුම මාධ්‍ය එකම වේදිකාවක් මත ඒකාබද්ධ වීමයි.
(4) විද්‍යුත් සබඳතා භාවිත කරමින් එක් පයීතයක් වෙතින් වෙනත් පයීතයක් වෙත ළඟා වීමයි.
(5) පහසුවෙන් ලබාගත හැකි වන සේ දත්ත පරිගණක ගත කිරීමයි.

24. සාධාරණ භාවිතය ( Fair Use ) යනු,

(1) නිර්මාණයක හිමිකම් අයිතිය උල්ලංඝනය කිරීමකි.
(2) නිර්මාණයක හිමිකම් අයිතිය උල්ලංඝනය නොකිරීමයි.
(3) නිර්මාණයක් විවේචනය හා විචාරයට යොදා ගැනීමට අවසර නොමැති බවයි.
(4) ප්‍රවෘත්ති වාර්තාකරණය සඳහා භාවිත කිරීමට ඇති නොහැකියාවයි.
(5) ඉගැන්වීම හා පර්යේෂණ සඳහා අවසර නොමැති බවයි.

25. මැතිවරණයක දී ඇතැම් ජනමාධ්‍ය ප්‍රසිද්ධ දේශපාලන පක්ෂයක් ප්‍රවර්ධනය කිරීමට උත්සාහ දැරූ බවට චෝදනා එල්ල විය. මෙය,

(1) මාධ්‍ය විස්තාරණයකි.
(2) මාධ්‍ය බලපෑමකි.
(3) මාධ්‍ය නියාමනයකි.
(4) මාධ්‍ය ප්‍රතිපෝෂණයකි.
(5) මාධ්‍ය විකෘතියකි.

26. 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතේ 9 (1) වගන්තිය අනුව ආර්ථික අයිතිවාසිකමේ මුල් අයිතිය රඳා පවතින්නේ,

(1) කර්තෘත්ව ස්වභාවය මත ය.

(2) ප්‍රකාශකයා මත ය.

(3) බෙදාහරින්නා මත ය.

(4) ග්‍රාහකයා මත ය.

(5) ආයතන හිමිකාරිත්වය මත ය.

- පහතින් දක්වා ඇත්තේ එදිනෙදා අපට හමුවන සිදුවීම් කිහිපයකි.

| A | B |
|---|---|
| A - විවාහ මංගල්‍යයක් | 5.සමාජ හා ජීවන චක්‍ර සිද්ධි |
| B - මැතිවරණ රැළියක් | 2.අධ්‍යාපනය හා වෘත්තීය සිද්ධි |
| C - නිදහස් දින උත්සවයක් | 3.දේශපාලන සිද්ධි |
| D - රැකියාවේ උසස්වීමක් | 4.ඒකාබද්ධ හා සාමූහික සිද්ධි |
| E - සංගීත සංදර්ශනයක් | 1. ක්‍රියා හා විනෝදාත්මක සිද්ධි |

27. ඉහත සිද්ධි පිලිප් කොට්ලර්ගේ සිද්ධි වර්ගීකරණයට සම්බන්ධ කළ විට නිවැරදි සබඳතාව පෙන්වන වරණය වන්නේ,

(1) A4, B3, C2, D1, E5.

(2) A3, B2, C4, D1, E5.

(3) A2, B5, C1, D3, E4.

(4) A5, B3, C4, D2, E1.

(5) A5, B4, C3, D2, E1.

28. ගෝලීය සංස්කෘතියට අයත් ලක්ෂණයක් නොවන්නේ,

1) අධිරාජ්‍යවාදී ආකෘතියෙන් ක්‍රියාත්මක වීම.

2) විඥාපන (තොරතුරු) සමාජයේ සංස්කෘතිය වීම.

3) සියලු ජාතික සංස්කෘතීන් සමජාතීයකරණය වීම.

4) බහුජාතික සමාගම් මගින් ක්‍රියාත්මක වීම.

5) මානව සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාප්ත වීම.

29. පුවත්පතක සිරස්තලය යෙදීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි සිසුන්ගෙන් විමසූ පැනයට ලැබුණු පිළිතුරු පහත පරිදි වේ.

A. නිර්මාණාත්මකව අදහස් ප්‍රකාශ කිරීම

B. සංක්ෂිප්තව ප්‍රකාශ කිරීම

C. නැවුම් බවින් යුක්ත වීම

D. පාඨක කුතුහලය ඇති නොවන අයුරින් රචනා කිරීම

ඉහත ප්‍රකාශය අතුරින් නිදොස් ප්‍රකාශ වන්නේ,

(1) ABC පමණි.

(2) B පමණි.

(3) BC පමණි.

(4) D පමණි.

(5) ABCD යන සියල්ලම.

30.

A. නිල වාර්තා, සිහි කැඳවීම්, ගැසට් නිවේදන, නිල විද්‍යුත් තැපැල.

B. සංඥා, මුද්‍රණාක්ෂර, ග්‍රැෆික් නිර්මාණ, චිත්‍ර සටහන්, සජීවීකරණ.

C. ශ්‍රවණ පොත්, සංගීත තැටි, කෘතිම ශබ්ද, සංගීතය, නිහඬ බව.

D. ඉරියව්, ඉඟි, මුද්‍රා, නර්තන විලාස, ආංගික අභිනය.

ඉහත A, B, C, D අයත් වන සන්නිවේදන ස්වරූප වන්නේ,

(1) විධිමත්, නිර්වාචික, ශ්‍රව්‍ය, දෘශ්‍ය.

(2) විධිමත්, දෘශ්‍ය, ශ්‍රව්‍ය, නිර්වාචික.

(3) ලිඛිත, නිර්වාචික, ශ්‍රව්‍ය, දෘශ්‍ය.

(4) නිර්වාචික, වාචික, දෘශ්‍ය, ශ්‍රව්‍ය.

(5) ලිඛිත, දෘශ්‍ය, නිර්වාචික, කථන.

- පන්තියක ළමුන් දස දෙනෙකු එක් දිනක දී සමාජ මාධ්‍ය පරිශීලනය කරන පැය ගණන පහත දැක්වේ. 31 සිට 33 දක්වා ප්‍රශ්නවලට එම සමීක්ෂණ දත්ත ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| ශිෂ්‍යයා/ශිෂ්‍යයාව | A | B | C | D | E | F | G | H | I | J |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පැය ගණන | 3 | 5 | 5 | 3 | 5 | 5 | 5 | 3 | 3 | 3 |

31. එක් අයෙක් දිනක දී සමාජ මාධ්‍ය පරිශීලනය කරන මධ්‍යන්‍ය කාලය වන්නේ,

(1) පැය 1යි.
(2) පැය 2යි.
(3) පැය 3යි.
(4) පැය 4යි.
(5) පැය 5යි.

32. ඉහත සියලු සිසුන් එදින සමාජ මාධ්‍ය පරිශීලනය කළ මධ්‍යස්ථ පැය ගණන,

(1) පැය 2කි.
(2) පැය 3කි.
(3) පැය 4කි.
(4) පැය 5කි.
(5) පැය 7කි.

33. සියලු ගැහැණු ළමයින් පැය 2 බැගින් සමාජ මාධ්‍ය ඇසුරු කර ඇත්නම් පිරිමි ළමයෙක් දිනක දී සමාජ මාධ්‍ය සමග ගත කරන සාමාන්‍ය කාලය වන්නේ,

(1) පැය 3යි.
(2) පැය 4යි.
(3) පැය 5යි.
(4) පැය 6යි.
(5) පැය 7යි.

34. ජනප්‍රිය සංස්කෘතියට අයත් ලක්ෂණයක් නොවන්නේ,

(1) විචිත්‍රවත් බවින් යුක්ත වීමයි.
(2) ජනප්‍රිය සංස්කෘතිය කර්මාන්තයක් බවට පත්ව තිබීමයි.
(3) විශාල ග්‍රාහක පිරිසකට සමීප වීමයි.
(4) සංකීර්ණ ස්වභාවයකින් යුක්ත වීමයි.
(5) මහා පරිමාණයෙන් නිෂ්පාදනය වීමයි.

35. නිර්වාචික සන්නිවේදනය පිළිබඳ පහත ප්‍රකාශ කියවන්න.

A. අප වඩාත්ම සන්නිවේදනයේ යෙදෙන්නේ නිර්වාචිකව ය.
B. සන්නිවේදකයෙකුට නිර්වාචික සන්නිවේදන අවබෝධය අවශ්‍ය වේ.
C. ඇතැම් නිර්වාචික සන්නිවේදන ක්‍රම විශ්වීය වේ.
D. වාචික සන්නිවේදනය තුළ ද නිර්වාචික ප්‍රකාශනයක් ඇතුළත්ව තිබිය හැකිය.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) A සහ B.
(2) C සහ D.
(3) A, B සහ C.
(4) A, B සහ D.
(5) A, B, C සහ D යන සිල්ලම ය.

36. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අර්ධ අධිකරණ බලතල සහිත නියාමන ආයතනයක් වන්නේ,

(1) ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය.

(2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය.

(3) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම.

(4) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය.

(5) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව.

37. මාධ්‍ය සංස්කෘතිය මගින් විවිධ ජන වර්ග අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇති කිරීමේ කාර්යය හඳුන්වන්නේ,

(1) සන්නිවේදනාත්මක කාර්යය ලෙසිනි.

(2) අනුකලනාත්මක කාර්යය ලෙසිනි.

(3) ප්‍රතිෂ්ඨාපන කාර්යය ලෙසිනි.

(4) අන්තර් සංස්කෘතික අධ්‍යයනය ලෙසිනි.

(5) දෘෂ්ටිවාදී කාර්යය ලෙසිනි.

38. සන්නිවේදනයේ කාර්යයන් පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.

- ❖ ආකල්පමය හෝ චර්යාමය වෙනසක් සිදු කෙරේ.
- ❖ වර්තමානයේ බොහෝ දුරට වාණිජ මුහුණුවරකින් ලාභ ඉපයීම ද සිදු කෙරේ.
- ❖ ආකර්ෂණීය බවකින් යුක්ත වීම සහ ආයාසයකින් තොරව සිදු කෙරේ.
- ❖ හුදු කරුණු දැක්වීමට සීමා නොවී වඩා සංවිධානාත්මක හා අර්ථකථනාත්මකව ඉදිරිපත් කෙරේ.

ඉහත කරුණුවලට අදාළ කාර්යයන් පිළිවෙළින් ඇති වරණය වන්නේ,

(1) අධ්‍යාපන, පෙළඹවීම, විනෝදාස්වාදය, තොරතුරු සම්පාදනය.

(2) තොරතුරු සම්පාදනය, විනෝදාස්වාදය, පෙළඹවීම, අධ්‍යාපන.

(3) විනෝදාස්වාදය, අධ්‍යාපන, පෙළඹවීම, තොරතුරු සම්පාදනය.

(4) පෙළඹවීම, විනෝදාස්වාදය, අධ්‍යාපන, තොරතුරු සම්පාදනය.

(5) පෙළඹවීම, තොරතුරු සම්පාදනය, විනෝදාස්වාදය, අධ්‍යාපන.

39. නව මුද්‍රා ආයතනයක නිල ලාංඡනය, තත්පර කිහිපයක් ඇතුළත වඩා නිර්මාණශීලීත්වයෙන් යුතුව සිදු කිරීමට සුරේෂ්ට භාවිත කළ හැකි නව මාධ්‍ය තාක්ෂණික ප්‍රවණතාවක් වන්නේ,

(1) අන්තර්ජාල ප්‍රොටෝකෝලය යි. ( Internal Protocols )

(2) වළාකුළු පරිගණක තාක්ෂණය යි. ( Cloud Computing )

(3) කෘත්‍රිම බුද්ධිය යි. ( Artificial Intelligence )

(4) අතථ්‍ය යථාර්ථය යි. ( Virtual Reality )

(5) සන්දර්භ දැනුම්වත් තාක්ෂණය යි. ( Context - aware technology )

40. මාධ්‍ය සාක්ෂරතාව, විචාරශීලී මාධ්‍ය පරිහරණය හා නිර්මාණශීලී චින්තනයෙන් දරුවන් බලසම්පන්න කළ යුතු බව අවධාරණය කරන ලද්දේ,

(1) Many Voices One World කෘතිය තුළිනි.

(2) චාල්ස් කූලිගේ සමාජ සංවිධානය කෘතිය විසිනි.

(3) වෝල්ටර් ලිප්මාන්ගේ ජනමතය කෘතියෙනි.

(4) විල්බර් ශ්‍රාම්ගේ සන්නිවේදන ආකෘතිය මගිනි.

(5) ගෲන්වොල්ට් ප්‍රකාශනය තුළිනි.

- පහත සඳහන් ප්‍රකාශ කියවන්න.

L - ප්‍රතිරූප ගොඩනංවා ගැනීමට උපකාරී වේ.

M - ග්‍රාහක කේන්ද්‍රීයව හා ආචාරශීලී ව භාවිත කෙරේ.

N - පුද්ගල ස්මෘතික ශක්තිය වැදගත් වේ.

O - පහසුවෙන් අන්තර් ක්‍රියාකාරී සන්නිවේදනයක යෙදීමට හැකි වේ.

41. ඉහත L, M ,N, O සඳහා ගැළපෙන සන්නිවේදන වර්ග පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,

(1) අන්තර්වර්තී, අන්තර්පුද්ගල, සමූහ, මහජන.

(2) මහජන, සමූහ, අන්තර්වර්තී, අන්තර්පුද්ගල.

(3) සමූහ, මහජන, අන්තර්පුද්ගල, අන්තර්වර්තී.

(4) අන්තර්වර්තී, අන්තර්පුද්ගල, සමූහ, ජන.

(5) මහජන, සමූහ, අන්තර්පුද්ගල, අන්තර්වර්තී.

42. "අන්තර් සංස්කෘතික අධ්‍යයනය" සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වනුයේ,

(1) විවිධ මානව කණ්ඩායම් අතර සංස්කෘතික, චර්යාත්මක හැසිරීම් රටා ආකල්ප ආදිය අතර සමවිෂමතා සොයි බලයි.

(2) එඩ්වර්ඩ් ටී.හෝල් සහ ජෝර්ජ් එල්. ට්‍රෙගර්ගේ අධ්‍යයනයන් මෙම විෂය සංවර්ධනයට හේතු විය.

(3) 1950 දශකයේ දී අන්තර් සංස්කෘතික සංවර්ධන සංකල්පය ආරම්භ වේ.

(4) සන්නිවේදන තාක්ෂණයේ දියුණුව හේතුවෙන් ලෝකයේ සංස්කෘති පිළිබඳ සමීප ව අධ්‍යයනය කිරීම අපහසු වී ඇත.

(5) සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ දී සංස්කෘති තුලනය කිරීම අන්තර් සංස්කෘතික අධ්‍යයනය ලෙස හඳුනාගත හැකිය.

43. මාධ්‍ය සන්දේශයක් විශ්ලේෂණය කිරීම සඳහා අදාළ කරගත හැකි කරුණු ඇතුළත් වරණය තෝරන්න.

(1) අර්ථය, අදාළ බව, පක්ෂපාතිත්වය, විශ්වසනීයත්වය.

(2) අදාළ බව, පක්ෂපාතිත්වය, විශ්ලේෂණය, අනුමානය.

(3) විශ්වාසනීයත්වය, උචිත බව, පෙළඹවීම, නිගමනය.

(4) පෙළඹවීම, පක්ෂපාතිත්වය, උචිත බව, විශ්ලේෂණය.

(5) අනුමානය, පෙළඹවීම, අර්ථය, නිගමනය.

44. පුවත්පතේ සරල, සෘජු වැකි සහිත භාෂාවක් භාවිත කරනු ලබන්නේ,

(1) ප්‍රවෘත්ති රචනයේදී ය.

(2) විශේෂාංග රචනයේදී ය.

(3) දැන්වීම් රචනයේදී ය.

(4) තීරු ලිපි රචනයේදී ය.

(5) කතු වැකි රචනයේදී ය.

45. රූපවාහිනි මාධ්‍යයේ මූලික ලක්ෂණ පිළිබඳ පාසල් මාධ්‍ය සමාජයේ සිසුන් කීපදෙනෙකු ඉදිරිපත් කළ අදහස් කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සුනෙත් | - | සංකීර්ණ තාක්ෂණයක් සහිතයි. |
| චමත් | - | පුද්ගල පූර්ණ අවධානය ග්‍රහණය කර ගනියි. |
| සයුරි | - | ගැටලු හා හැඟීම් ප්‍රකාශයට වඩාත් උචිතයි. |
| ඔමරි | - | ජාතික, ජාත්‍යන්තර ලක්ෂණවලින් යුක්තයි. |

මේ අතුරින් සත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) සයුරි පමණි.

(2) චමත් පමණි.

(3) සයුරි, චමත්, සුනෙත් පමණි.

(4) ඔමරි හා චමත් පමණි.

(5) සුනෙත්, චමත් හා ඔමරි පමණි.

46. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සන්නිවේදනය සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් අදාළ වන්නේ එහි,

(1) 14 වන වගන්තිය යි.

(2) 10 වන වගන්තිය යි.

(3) 19 වන වගන්තිය යි.

(4) 15 වන වගන්තිය යි.

(5) ඉහත කිසිවක් නොවේ.

47. සංවර්ධනය සඳහා සන්නිවේදනයේ දී අවශ්‍යතා කේන්ද්‍රීයත්වය යන්නෙන් අදහස් වන්නේ,

(1) පරිසර විද්‍යාත්මක සමබරතාව ගොඩනැගීම සඳහා සන්නිවේදනය යොදා ගැනීමයි.

(2) ප්‍රජාතන්ත්‍රවාදී සවිඥානිකත්වය ඉහළ දැමීමට සහ ප්‍රජා සහභාගීත්වය වර්ධනය කිරීමට සන්නිවේදනය යොදා ගැනීමයි.

(3) සංවර්ධනය පිළිබඳ පැහැදිලි විශ්වාසයක් තමා විසින් ම අවබෝධයක් ඇති කර ගැනීම සඳහා සන්නිවේදනය භාවිත කිරීමයි.

(4) සෞඛ්‍ය සේවා, පෝෂණය, සනීපාරක්ෂාව, මානව හිමිකම් නවාතැන් අවශ්‍යතා ඉටු කරගැනීමට සංවර්ධනය සඳහා සන්නිවේදනය යොදා ගැනීමයි.

(5) පාර්ශ්ව දෙකක් හෝ ඊට වැඩි පාර්ශ්ව ගණනක් අතර පවත්නා මත භේදයකට සාමකාමී විසඳුමක් සපයා ගැනීම සඳහා සන්නිවේදනය භාවිත කිරීමයි.

48. අතුරුදහන් වූ පුද්ගලයෙක් සොයාගැනීමට දරන උත්සාහයකදී අතුරුදහන් වූ ස්ථානයේ තිබූ අකුරු දෙකක් සහිත මුද්දක රූප රාමුවක් ප්‍රවෘත්ති විකාශයේ දී පෙන්වන ලදී. මෙම මුදුව පෙන්වීමට වඩාත් උචිත වන රූප රාමුව විය හැකි වන්නේ,

(1) සමීප රූප ය.

(2) මධ්‍යම සමීප රූප ය.

(3) මධ්‍යම දුර

(4) මධ්‍යම දුර රූප ය.

(5) අතිසමීප රූප ය.

49. මාධ්‍ය ප්‍රවණතා හමුවේ ධනවාදී ආර්ථික ක්‍රමයක දී කලාව, ආගම, ඖෂධ යනාදියට මිලක් නියම වන බව කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් ඒංගල්ස් දාර්ශනිකයන් දක්වන්නේ,

(1) පාරිභෝජ්‍යකරණයේ දී ය.

(2) භාණ්ඩකරණයේ දී ය.

(3) වාණිජකරණයේ දී ය.

(4) ගෝලීයකරණයේ දී ය.

(5) නිර්මහාපරිමාණකරණයේ දී ය.

50. ඉරිදා දින පැවැත්වීමට නියමිත අන්තර් පාසල් ක්‍රිකට් තරගාවලිය පිළිබඳ පුවතක් පාසල් උදා විකාශනයෙන් ප්‍රචාරය විය. ඒ සමග 12 ශ්‍රේණියේ සිසුහු ප්‍රීති ඝෝෂා නගමින් ඊට සහභාගි වන අයුරු සාකච්ඡා කළහ. එම අවස්ථාව අයත් වන සන්නිවේදන වර්ගය වන්නේ,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනය යි.

(2) ජන සන්නිවේදනය යි.

(3) සමූහ සන්නිවේදනය යි.

(4) අතථ්‍ය සන්නිවේදනය යි.

(5) මහජන සන්නිවේදනය යි.

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி cau; கல்வி kw;Wk; njhopw; கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv.Level) Examination, 2025

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය **II**
தொடர்பாடலும் ஊடகக் கற்கையும் **II**
Communication and Media Studies **II**

**29** | **S** | **II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න**

උපදෙස්:

❖ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 40 කි.

## II කොටස

01). ජනමාධ්‍ය තවදුරටත් සන්නිවේදන ක්ෂේත්‍රය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

(i) ජනමාධ්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04)

(ii) ජනමාධ්‍යයේ විශේෂතා දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ගුවන්විදුලි හඬ ශිල්පියෙකු ස්වකීය හඬ භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් විස්තර කරන්න. (ලකුණු 12)

(iv) රූපවාහිනී මාධ්‍යයේ යහපත් සහ අයහපත් සමාජ බලපෑම් දෙක බැගින් විග්‍රහ කරන්න. (ලකුණු 16)

02). සන්නිවේදනය හා මාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධ පුරවැසියෙකුට ඉතා වැදගත් වේ.

(i) ජන සන්නිවේදනය පිළිබඳ HUB ආකෘතියට ඇතුළත් ප්‍රධාන අංග 4ක් නම් කරන්න. (ලකුණු 04)

(ii) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන විෂය හැදෑරීමේ අවශ්‍යතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) `වෙළෙඳ දැන්වීම් මගින් මිත්‍යාව ජනනය කරයි.` ඉහත ප්‍රකාශය කරුණු තුනක් (03) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 12)

(iv) ගෝලීය සංස්කෘතිය හේතුවෙන් සමාජයට ඇති වී තිබෙන හිතකර හා අහිතකර බලපෑම් දෙක (02) බැගින් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 16)

03). අන්තර්ජාල පුවත්පතක් නිර්මාණය කිරීමට ඔබේ මිතුරා ඔබට ඇරයුම් කරයි.

(i) අන්තර්ජාල පුවත්පත අයත් වන සන්නිවේදන වර්ගීකරණය කුමක්ද? (ලකුණු 04)

(ii) පුවත්පතක අන්තර්ගත වන සන්නිවේදන ස්වරූප දෙකක්(02) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) අන්තර්ජාලය ඔස්සේ මහජන සම්බන්ධතා සිදු කළ හැකි ආකාර තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) විධිමත් සන්නිවේදනයේ විශේෂතා හතරක්(04) අවිධිමත් සන්නිවේදනය හා සසඳමින් විස්තර කරන්න. (ලකුණු 16)

04).

(i) අතථ්‍ය සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)

(ii) මාධ්‍ය සාක්ෂරතාව යටතේ අර්ථ දැක්වෙන පහත සඳහන් ක්ෂේත්‍ර දෙක(02) කෙටියෙන් පැහැදිලි කරන්න.

(1) දෘශ්‍ය සාක්ෂරතාව.

(2) ශ්‍රව්‍ය සාක්ෂරතාව. (ලකුණු 08)

(iii) මාධ්‍ය නියාමනය සඳහා භාවිතා කරන මූලික ප්‍රවේශ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 12)

(iv) මාධ්‍ය විචාරයට අයත් වන පහත සඳහන් කරුණු උදාහරණ සහිතව විස්තර කරන්න.

I. මාධ්‍ය හා දෛනික ජීවිතය

II. සන්දේශ ආධිපත්‍යය

III. මාධ්‍ය ආර්ථිකය

IV. මාධ්‍ය හා තාක්ෂණය (ලකුණු 16)

05). නව මාධ්‍ය සහ සමාජ මාධ්‍ය රටක සංවර්ධනය සඳහා උපයෝගී කරගැනීම ඵලදායක වේ.

(i) නව මාධ්‍ය ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂාවක් වන ස්වයං නීර්ණයට අදාළ කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) කෘෂිකාර්මික නවෝත්පාදනය සහ ආහාර සුරක්ෂිතතාව සඳහා සමාජ මාධ්‍ය භාවිතයට ගත හැකි ආකාර තුනක්(03) විස්තර කරන්න. (ලකුණු 12)

(iv) සමාජ මාධ්‍යයේ යහපත් බලපෑම් හතරක් නිදසුන් සහිතව විග්‍රහ කරන්න. (ලකුණු 16)

06). “ වඩා හොඳ නිර්මාණාත්මක සන්නිවේදන ශක්‍යතා වර්ධනය කර ගැනීමෙන් සන්නිවේදන කාර්ය ඵලදායී ලෙස ඉටුකර ගත හැකිය.”

(i) නිර්මාණශීලීත්වයේ මූලිකාංග හතරක් නම් කරන්න. (ලකුණු 04)

(ii) පුවත්පත් විශේෂාංග වර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) රූපවාහිනී හා සිනමා නිර්මාණකරණයේ දී භාවිත වන කැමරා වර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) “ ස්වභාව සෞන්දර්ය සුරකිමු” මැයෙන් සංවර්ධනාත්මක සන්දේශයක් ප්‍රබල ලෙස ජනගත කිරීම සඳහා යොදා ගත හැකි ජනශ්‍රැතිකාංග මොනවාදැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

07). සන්නිවේදන තාක්ෂණයේ දියුණුව හේතුවෙන් එක් එක් රටවල මාධ්‍ය ප්‍රතිපත්ති අභියෝගයට ලක් වෙමින් පවතී.

I. සමීක්ෂණයක දී භාවිතයට ගත හැකි දත්ත රැස් කිරීමේ ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

II. මාධ්‍ය ප්‍රතිපත්තිවල අන්තර්ගත වන ප්‍රධාන කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

III. සමීක්ෂණයකට අදාළව දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 12)

IV. රටකට මාධ්‍ය ප්‍රතිපත්ති වැදගත් වන්නේ ඇයි ද යන්න පහත සඳහන් කරුණු ඔස්සේ විස්තර කරන්න.

( අ ) අපක්ෂපාතීත්වය හා සාධාරණත්වය.

( ආ ) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීම.

( ඇ ) සියලුම මාධ්‍ය ආයතනවල කාර්යභාරය ස්වාධීන කිරීම.

( ඈ ) මාධ්‍ය ආචාරධර්ම ප්‍රවර්ධනය.

( ලකුණු 16 )

***********

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv.Level) Examination, 2025

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

පිළිතුරු

| | | | | |
|---|---|---|---|---|
| 1. 2 | 13. 4 | 25. 1 | 37. 2 | 49. 2 |
| 2. 3 | 14. 2 | 26. 1 | 38. 5 | 50. 3 |
| 3. 3 | 15. 5 | 27. 4 | 39. 3 | |
| 4. 4 | 16. 2 | 28. 2 | 40. 5 | |
| 5. 3 | 17. 4 | 29. 1 | 41. 2 | |
| 6. 3 | 18. 3 | 30. 2 | 42. 4 | |
| 7. 5 | 19. 4 | 31. 4 | 43. 1 | |
| 8. 2 | 20. 2 | 32. 3 | 44. 1 | |
| 9. 3 | 21. 5 | 33. 3 | 45. 5 | |
| 10. 4 | 22. 2 | 34. 4 | 46. 3 | |
| 11. 3 | 23. 3 | 35. 5 | 47. 4 | |
| 12. 4 | 24. 2 | 36. 2 | 48. 5 | |
| | | | | |

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
Communication and Media Studies II

II පත්‍රය - පිළිතුරු

1.

(I) පුවත්පත

ගුවන්විදුලිය

රූපවාහිනිය

පොත්

සඟරා

(ලකුණු 04)

( II)

- ❖ තාක්ෂණික මෙවලම් භාවිත කිරීම
- ❖ ක්ෂණික හා අඛණ්ඩතාවකින් යුක්ත වීම
- ❖ සංවිධානගත ආයතනික ව්‍යුහයකින් සමන්විත වීම
- ❖ වෘත්තීය සන්නිවේදකයෝ සිටීම
- ❖ බහුවිධ දොරටුපාලක ක්‍රියාවලියකට යටත් වීම
- ❖ ප්‍රමාදිත පතිපෝෂණයක් දක්නට ලැබීම
- ❖ බොහෝ විට වාණිජත්වය පදනම් කර ගැනීම

(ලකුණු 08)

(III)

- කටහඬෙහි මධුර බව
- කටහඬෙහි පැහැදිලි බව
- හඬෙහි තීව්‍රතාවය
- පැහැදිලිව නිරවුල්ව වචන උච්ඡාරණය
- වාක් සංයමය පුහුණු කිරීම
- වැඩසටහනට යෝග්‍ය වන ලෙස, උචිත වන ලෙස හඬ භාවිතා කිරීම.

(ලකුණු 12)

(IV) රූපවාහිනියේ යහපත් බලපෑම

- දෛනික ජීවිතයේ ජීවන රටාවන්ට සිදු කරන බලපෑම
    - තොරතුරු සම්පාදනය
    - විනෝදාස්වාදය ලබාදීම
    - යහපත් දේ සඳහා පෙළඹවීම
        1. යහපත් සෞඛ්‍ය ආරක්ෂාව
        2. සෞඛ්‍ය පුරුදු
        3. පරිසරය ආරක්ෂා කිරීම

    - අධ්‍යාපනික කාර්යය සඳහා පෙළඹවීම
    - ආර්ථික, සමාජ, දේශපාලනික, සංස්කෘතික ප්‍රවණතා නිර්මාණය කිරීම

රූපවාහිනියේ අයහපත් බලපෑම

- ❖ ප්‍රචණ්ඩත්වය
- ❖ ලෝලත්වය
- ❖ ඇබ්බැහිවීම
- ❖ ගැටලුවලින් මඟ හැර යාමට (ලකුණු 16)

( 02 )

(I)

- සන්නිවේදකයෝ
- කේත
- දොරටුපාලකයෝ
- ජනමාධ්‍ය
- නියාමකයෝ
- පෙරහන් (Filters)
- ග්‍රාහක ක්ෂේත්‍රය
- බලපෑම
- ප්‍රතිපෝෂණය
- මාධ්‍ය විස්තාරණය
- මාධ්‍ය විකෘතිය සහ සෝෂාව

( ලකුණු 04 )

( II )

- සන්නිවේදන කුසලතා වර්ධනය
- මාධ්‍ය සාක්ෂරතාවය
- නිර්මාණශීලී සන්නිවේදන කුසලතා වර්ධනය
- විචාරශීලී මාධ්‍ය පරිහරණය
- අවස්ථාවෝචිත භාෂා භාවිතය
- මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය
- මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම
- තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය
- මාධ්‍ය ආචාරධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධය
- යහපත් පුරවැසියෙකු ලෙස සංවර්ධනයට දායක වීම

මෙම කරුණුවලින් දෙකක් කෙටියෙන් පැහැදිලි කර තිබීමට ලකුණු ලබාදෙන්න.

(ලකුණු 08)

( iii )

- පෙළ
- රූප
- සැඟවුණු අර්ථ යන මෙම කරුණු තුන ඇසුරින් විස්තර ඇතුළත් කර තිබීම.

(ලකුණු 12)

(iv) <u>හිතකර බලපෑම්</u>

- ආර්ථිකයේ ගෝලීයකරණයට සමගාමීව දේශපාලනයේ, සංස්කෘතිය සහ අධ්‍යාපනයේ මාධ්‍ය ඇතුළු ක්ෂේත්‍රවල ගෝලීයකරණය නිසා ඇති වූ ප්‍රවණතා විස්තර කර තිබීම.

  උදා:-

  - ❖ තොරතුරු ක්ෂණයෙන් ලබා ගැනීමට හැකි වීම
  - ❖ සන්නිවේදන තාක්ෂණයේ දියුණුව / විශ්ව ගම්මානය සංකල්පය
  - ❖ බහුජාතික සමාගම්වල ක්‍රියාකාරීත්වය ලෝකයේ ම ආර්ථික ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීම

<u>අහිතකර බලපෑම්</u>

- ජාතික සංස්කෘති ඒකාකාර වීම සහ සමජාතීකරණය වීම
- ජාතික සංස්කෘතීන්ට ආවේණික වූ ආහාර, භාෂා විලාසිතා අධ්‍යාපනය, ජාතික චින්තන සංස්කෘතිය ආදිය තර්ජනයට ලක් වීම විස්තර කර තිබීම.

(ලකුණු 16)

3. ( I ) අතථ්‍ය සන්නිවේදනය (ලකුණු 04)

(ii) **ලිඛිත ස්වරූපය**

පුවත්පත්වල තොරතුරු අදහස් පණිවිඩ ලේඛනය මඟින් ඉදිරිපත් කරයි. වචන, සංකේත ආදිය මඟින් නිර්මාණාත්මකව රචනා කරනු ලබයි.

**වාචික ස්වරූපය**

පුවත්පත්වල තොරතුරු ලිඛිත වචන මඟින් ඉදිරිපත් කෙරේ. වචන ගැළපීමෙන් වාක්‍ය, ඡේද ආදියෙන් සමන්විත ය.

**දෘෂ්‍ය ස්වරූපය**

පුවත්පතක් දැකීමෙන් තොරතුරු ග්‍රහණය කර ගනී. වචන, ඡායාරූප, සිතියම්, කාටූන්, ප්‍රස්තාර, චිත්‍ර ආදිය තොරතුරු සන්නිවේදනයට යොදා ගනී.

(ලකුණු 08)

(iii) ඡායාරූප පළ කිරීම, වීඩියෝ පළ කිරීම, විද්‍යුත් තැපැල භාවිතය, E mail අයදුම්පත්‍ර නිකුත් කිරීම / භාර ගැනීම (ගූගල්ෆෝම්) සමීක්ෂණය කිරීම, සමූහ වශයෙන් සම්මන්ත්‍රණ තොරතුරු නිකුත් කිරීම, සජීවී විකාශය - (streaming)

(iv)

| විධිමත් සන්නිවේදනය | අවිධිමත් සන්නිවේදනය |
|---|---|
| 1. සැලසුම් සහගතය | අහඹු හෝ සැලසුම් සහගත නොවේ. |
| 2. සන්නිවේදනය, පැහැදිලිව හඳුනාගත හැකිය. | සන්නිවේදනය හඳුනාගත නොහැක |
| 3. නිල වශයෙන් නිකුත් කරන තොරතුරු දැකගත හැකිය | නිල භාවයෙන් තොරව තොරතුරු සංසරණය වේ. |
| 4. ක්‍රියාපටිපාටියකට අනුව නිශ්චිත පියවර ගණනාවකින් ක්‍රියාත්මක වේ. | තොරතුරු ගමන් කිරීමේ නිශ්චිත ක්‍රම වේදයක් නොමැත. |
| 5. මූලාශ්‍රය හඳුනාගත හැකිය. | නිශ්චිත මූලාශ්‍රයක් හඳුනාගත නොහැක. |

මෙම කරුණු සන්සන්දනාත්මකව විස්තර කර තිබීම.

- අධ්‍යයන කාර්ය සඳහා.
- සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා.
- ව්‍යාපාරික කටයුතු සාර්ථකව කාර්යක්ෂමව සිදු කර ගැනීම සඳහා.
- ප්‍රචාරණ කටයුතු සඳහා.
- නිර්මාණාත්මක කාර්යය සඳහා
- චින්තනය පුබුදුවාලීම සඳහා.

(ලකුණු 12)

( II )

දෘශ්‍ය සාක්ෂරතාව

ශ්‍රව්‍ය සාක්ෂරතාව

( III ) ස්වයං නියාමනය

- ❖ රාජ්‍ය මැදිහත්වීමෙන් තොරව ස්වේච්ඡාවෙන් සිදු වේ.
- ❖ මාධ්‍ය හිමිකරුවන්, සංස්කාරකවරුන්, ජනමාධ්‍යකරුවන් විසින් සිදු කරනු ලබයි.
- ❖ මාධ්‍ය වෘත්තිකයන්ගේ මැදිහත්වීම සහිතව මාර්ගෝපදේශ / ආචාර ධර්ම සකස් කරයි.
- ❖ මාධ්‍ය ගැටලු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කරයි.

<u>නියාමකයා</u>

- ❖ රාජ්‍ය මැදිහත්වීමක් සහිත ය.
- ❖ මාධ්‍ය නියෝජිතයන්ගේ මැදිහත්වීමක් සහිතව නීත්‍යානුකූලව ස්ථාපනය කරන ලද්දකි.
- ❖ සකස් කරගත් මාර්ගෝපදේශ හා ආචාර ධර්ම සංග්‍රහයන්ට අනුව තීන්දු හා නිර්දේශ ලබාදෙන අතර ඒවා නොසලකා හැරිය නොහැකිය.

<u>ව්‍යවස්ථාපිත නියාමකයා</u>

- ❖ නීතිය මඟින් ස්ථාපිත නියාමන ක්‍රමයකි.
- ❖ සිවිල් සමාජ කණ්ඩායම්, නීතඥ කණ්ඩායම් හා ශාස්ත්‍රාලයීය පර්යේෂකයෝ මණ්ඩලයේ සාමාජිකත්වය දරති.
- ❖ දේශපාලන බලපෑම මත ස්වාධීනත්වය අහෝසි වී යා හැකිය.
- ❖ මාධ්‍ය දැඩි ලෙස පාලනය කිරීමේ හැකියාව පවතී.

<u>අභ්‍යන්තර නියාමකයා</u>

- ❖ ආයතන මට්ටමින් අභ්‍යන්තරව පවත්වාගෙන යන නියාමන ක්‍රමයකි.
- ❖ පැමිණිලි පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයෙකු පත්කරගනී.
- ❖ වෘත්තීයභාවය අතින් ඉහළ මට්ටමක පවත්නා මාධ්‍ය ආයතනවලට මෙය වඩාත් යෝග්‍ය වේ.

**(IV)** දී ඇති කරුණු හතරට (04) ට අදාළ උදාහරණ දක්වමින්, එය මාධ්‍ය විචාරය සම්බන්ධ කරමින් ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.

5.

I. අංකිතකරණය ( Digitalization)
II. ජාලගතකරණය ( Networking)
III. අන්තර් ක්‍රියාකාරීත්වය (Interactive)
IV. අධිපාඨනීයත්වය (Hypertextuality)
V. ස්වයංකරණය (Automation)
VI. දත්ත සංචිතකරණය (Database)
VII. වේගවත් සංදේශකරණය (Fastest Messaging)

(II)

- ❖ ස්වයං නීර්ණය සතු මිනිසුන් තමාගේ පුද්ගල අවශ්‍යතා සම්බන්ධ ප්‍රවණතා හා මනෝවිද්‍යාත්මක අවශ්‍යතා සැලකිල්ලට ගෙන මානව අභිප්‍රේරණ හා පෞරුෂය පිළිබඳව අවබෝධයෙන් යුතුව ක්‍රියා කිරීමයි.
- ❖ ස්වයං නිර්ණය යනු මානසික යහපැවැත්මේ අංගයකි.

ඒ සඳහා,

I. ස්වාධීනත්වය
II. නිපුණතාව
III. සම්බන්ධතාවය යන කාරණා වැදගත් වේ. ඒවා පිළිබඳව දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(III)

I. ප්‍රජා මූලික ග්‍රාමීය ගුවන් විදුලි වැඩසටහන් හෝ Video You Tube හරහා ඉදිරිපත් කිරීම.

II. විවිධ කෘෂිකාර්මික යෙදවුම් ( apps) හඳුන්වා දීම.

III. ප්‍රජා පාදක ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීමේ, දැනුවත් කිරීමේ Post පළ කිරීම ( Face book )

IV. දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීමේ ක්‍රමවේද රැසක් Blogs, YouTube Video, FB Post මඟින් දැනුවත් කිරීම.

V. කෘෂිකාර්මික නවෝත්පාදක හා ආහාර සුරක්ෂිතතාව සඳහා ග්‍රාමීය සන්නිවේදන පද්ධති සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම. ( SMS යැවීම, ඡායාරූප හුවමාරුව, ආදී ක්‍රම භාවිතයට ගැනීම.

(IV)

1. පරිහරණය කරන පුද්ගලයාට ඇගයීමට හා අන්තර්ගතය සංස්කරණය කළ හැකිවීම.
2. පරිශීලකයාගේ අභිමතය අනුව පරිහරණය කළ හැකි වීම.
3. ග්‍රාහකයාට කැමති ලෙස පරිහරණය කළ හැකියාව
4. සක්‍රීය ග්‍රාහකයන් වීමට හැකියාව තිබීම.
5. දැනුම හුවමාරු කරගැනීමේ හැකියාව
6. ඉගෙනුම් ක්‍රියාවලියට යොදා ගත හැකි වීම
7. ගැටලු සහ හැඟිම් ප්‍රකාශනයට හැකි වීම
8. සරල පිරිවැය අඩු ක්‍රමයක් වීම.
9. සමාජ මාධ්‍යයෙන් යහපත් බලපෑම් විමසිය යුතුයි. උදාහරණ දක්වමින් විස්තර කළ යුතුයි.

( 06 )

( I )

- නිර්මාණය
- නිර්මාණශීලීත්වය
- නිර්මාණාත්මක චින්තනය
- නිර්මාණ ශිල්පියා

( ලකුණු 04 )

( ii )

විශේෂාංග ලිපි

තීරු ලිපි

කතුවැකි

චිත්‍ර කතා

විචාර

සංවාද

පාඨක අදහස්

ඡායාරූප

චිත්‍රපට වාර්තා මෙම කරුණු අතරින් 02 විස්තර කර තිබීම.

( ලකුණු 08 )

( iii )

සමීප රූපය

ඉතා සමීප රූපය

අති සමීප රූපය

මධ්‍යම රූපය

මධ්‍යම සමීප රූපය

මධ්‍යම දුර රූපය

අතිදුර රූපය

ඉතා දුර රූපය

දුර රූපය වැනි කැමරා කෝණ අතරින් තුනක් පිළිබඳ විස්තර කර තිබීම.

( ලකුණු 12 )

(iv )

ජනකතා

ජන කවි

ජන ඇදහිලි

ශාන්ති කර්ම හා යාතු කර්ම

ගැමි නාටක ආදී ජනශ්‍රැතිකාංග ඇසුරෙන් ප්‍රශ්නයට අදාළව උදාහරණ සහිතව කරුණු විස්තර කර තිබීම.

07.

( I )

1. ප්‍රශ්නාවලි
2. සම්මුඛ සාකච්ඡා

( II )

1. මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරීත්වය
2. තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය
3. මහජනතාව සමඟ මාධ්‍ය සම්බන්ධතාව
4. මාධ්‍ය අධිකාරීන් හා වෙළෙඳපළ නියාමනය සම්බන්ධ වීම.

( III )

1. ගැටළුවලට අදාළ විසඳුම් කරා එළඹීමට අවශ්‍ය දත්ත ලබාගත හැකිවන පරිදි ප්‍රශ්නාවලිය සැකසිය යුතු ය.
2. සමීක්ෂණ සිදු කිරීමේ දී එහි මූලික අරමුණට ගැළපෙන ආකාරයට ප්‍රශ්නාවලිය සකස් කළ යුතු ය.
3. ප්‍රශ්නාවලිය සඳහා නිශ්චිත පිළිතුරු ලබා දීමට ග්‍රාහකයාට පහසුවන ආකාරයට ප්‍රශ්නාවලිය සකස් කළ යුතු ය.
4. අධ්‍යාපනික මට්ටම, වයස් සීමාව, ආදායම් මට්ටම භාෂාව ආදි දත්ත දායකයන්ගේ ස්වභාවය හඳුනාගෙන ඊට ගැළපෙන ආකාරයට ප්‍රශ්නාවලි ගොඩනැඟිය යුතු ය.
5. ඍජු පිළිතුරු නොලැබෙතැයි අපේක්ෂා කරන ප්‍රශ්න වක්‍ර ආකාරයෙන් විමසිය යුතු ය.
6. සීමාසහිත ප්‍රශ්න සංඛ්‍යාවක් ඇතුළත් කළ යුතු ය.
7. ප්‍රමුඛතාව අනුව ප්‍රශ්න පෙළ ගැස්විය යුතු ය.

8. එසේම ප්‍රශ්නාවලි සකස් කිරීමේ දී පහත සඳහන් කරුණුවලින් වැළකී සිටීම සුදුසු ය.
   1. පක්ෂපාත පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්න සැකසීම
   2. දීර්ඝ ප්‍රශ්න ඇසීම
   3. අනුමාන ප්‍රශ්න ඇසීම
   4. ව්‍යාකූල ප්‍රශ්න ඇසීම
   5. දත්ත දායකයන් අපහසුතාවයට පත්වන ප්‍රශ්න ඇසීම
   6. එකම ප්‍රශ්නය නැවත නැවත ඇසීම

( IV ) රටක මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී මූලික අංගයක් වන්නේ රටක පාලන රාමුවයි. ඒ අනුව උක්ත කාරණා හතර ඒ ඒ මාතෘකාවට ගැළපෙන ලෙසට විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

( මාධ්‍ය ප්‍රතිපත්ති වැදගත් වන්නේ ප්‍රතිපත්ති ගරුක මාධ්‍යවේදියෙක් බිහිකිරීම, ජාතිවාදීත්වය, පක්ෂපාතීත්වය, බැහැර කරන යහපත් මාධ්‍ය භාවිතයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙනි.)

එහි දී,

- ප්‍රජා අතර සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රකාශන නිදහස සහතික කිරීම.
- විවිධ සංස්කෘති හා ප්‍රජා අතර සමඟිය ප්‍රවර්ධනය කිරීම.
- සියලුම මාධ්‍ය ආයතනවල කාර්යභාරය ස්වාධීන කිරීම.
- සංස්කෘතික නිදහස ප්‍රවර්ධනය.
- ආචාර ධර්ම හා සදාචාරාත්මක මාධ්‍ය ක්ෂේත්‍රයේ විනිවිදභාවය ගොඩනැඟීම.
- මාධ්‍ය නියාමනය.
- මාධ්‍ය ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පුහුණු අවකාශ සැලසීම.
- තාක්ෂණික හා යටිතල පහසුකම් සංවර්ධනය යනාදිය ඇතුළත්ව පිළිතුරු ගොඩනඟා ඇත්නම් ලකුණු ලබා දෙන්න.